සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

6 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 62 S

නම ..............................................

පුරවැසි අධ්‍යාපනය I - කොටස

කාලය පැය දෙකයි

● සැළකිය යුතුයි:-

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- 1 - 5 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

01. පවුල හැරුණ විට සිසුන් යහපත් පුරවැසියන් කිරීමට උපකාරී වන ආයතනය වන්නේ ............................................. යි.
( පාසල/ අතිරේක පංතිය/ ක්‍රීඩා පිටිය/ ළමා සමාජය)

02. පාසලේ ප්‍රධාන පරිපාලන තනතුර වන්නේ ........................................................
(නියෝජ්‍ය විදුහල්පති / විදුහල්පති/ ජ්‍යෙෂ්ඨ අංශ ප්‍රධාන/ ප්‍රධාන ශිෂ්‍ය නායක)

03. පාසලේ සංවිධාන ව්‍යුහයට අයත් නොවන පිරිස වන්නේ ...................................................................... ය.
( ශිෂ්‍ය නායකයන් /ආදි සිසුන් / අනධ්‍යයන කාර්ය මණ්ඩලය / ගුරු මණ්ඩලය)

04. ඔබගේ ජීව දත්ත පත්‍රිකාවේ ඇතුළත් වන්නේ ......................................................... තොරතුරු යි.
(පියා පිළිබඳ / ඔබ පිළිබඳ / විදුහල්පති පිළිබඳ/ පංතිභාර ගුරුතුමිය පිළිබඳ)

05. ................................................................ පාසල් සිසුවකු වශයෙන් ඔබගේ වගකීම කි.
( පාසලේ සම්පත් ආරක්ෂා කිරීම / විනය නීති කඩකිරීම/ ගුරු ඇගයීම් කටයුතු / පෙළපොත් බෙදා දීම)

- අංක 06 - 10 දක්වා ප්‍රශ්න වල ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද, ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

06. උප්පැන්න සහතිකයෙන් ඔබගේ නම නිවැරදි බව තහවුරු කරගත හැකි ය. ( )

07. C.W.W. කන්නන්ගර මැතිතුමා 1947 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සභාපතීත්වය දැරී ය. ( )

08. පවුල තුළින් පුද්ගලයෙකුගේ හැකියා හා දක්ෂතා වර්ධනය කරගත හැකි ය. ( )

09. ඉවසීම නැතිකම සාර්ථක පුද්ගලයෙකුගේ චරිත ලක්ෂණයක් වේ. ( )

10. මිතුරන් සමඟ දැනුම හුවමාරු කර ගැනීම තම ඉලක්ක ජයගැනීම සඳහා යොදාගත හැකි ක්‍රමවේදයකි. ( )

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11. ඔබේ දක්ෂතා වර්ධනය කර ගැනීම සඳහා කළ යුත්තේ මින් කුමක් ද?
1. අනුන් දෙස බලා සංසන්දනය කිරීම යි. 2. තම දක්ෂතා අවස්ථානුකූලව පෙන්වීම යි.
3. නිහඬව බලා සිටීම යි. 4. පුවත්පත් කියවීම යි.

12. දුර්වලතා අවම කර ගැනීම සඳහා පුද්ගලයෙකු කළ යුත්තේ මින් කුමක් ද?
1. තම දුර්වලතා හඳුනා ගැනීම යි. 2. විරුද්ධවාදීන් පරාජය කිරීම යි.
3. බොරු කීම යි. 4. තර්කානුකූලව කතා කිරීම යි.

13. ළමා මිතුරු පාසල් පරිසරයක දැකිය හැකි ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
1. ප්‍රජා සහභාගීත්වය හිගවීම. 2. ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනයක් පැවතීම.
3. ළමයින්ගේ මූලික හිමිකම් නොමැති වීම. 4. සුරක්ෂිත ඉගෙනුම් පරිසරයක් තිබීම.

14. අභියෝග ජය ගැනීම සඳහා වර්ධනය කරගත යුතු ගුණාංගය කි.
1. ආත්ම විශ්වාසය 2. ක්‍රීඩා කටයුතු වල යෙදීම.
3. ගුරුවරුන්ට කීකරු වීම. 4. යහළුවන් සමඟ කටයුතු කිරීම.

15. සැලසුම්කරණය හා සංවිධානය නිසා,
1. ගැටළු උග්‍ර වෙයි. 2. කාලය නාස්ති වෙයි.
3. සිතේ පිඩාකාරී බව අඩුවෙයි. 4. සම්පත් අපතේ යයි.



LIVEWORKSHEETS

- **16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පින්තූර ඇසුරින් පිළිතුරු සපයන්න.**




A

16. A පින්තූරයෙන් දැක්වෙන්නේ ............................................................ මැතිතුමාය.

17. එතුමා බාලාංශයේ සිට විශ්වවිද්‍යාලය දක්වා ..................................... ලබාදීමට කටයුතු කළේය.

18. ඔහු ........................................................................... යන විරුදාවලියෙන් හඳුන්වයි.



B

19. B පින්තූරයෙන් දැක්වෙන්නේ ............................................................ මැතිතුමාය.

20. ඔහු ........................................................................... බිහි කිරීමට පුරෝගාමී විය.

(ල. 2 x 20 = 40 )



LIVEWORKSHEETS